

# සංක්‍රමණිකයකුගේ සටහන

### කම්කරු දිනය

ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීම ගැන ලිවිය යුත්තේ මොනවගේ සටහනක්ද කියන එකත් දැන් ගැටළුවක්. මේ වනවිට ඉතිරි වී ඇත්තේ කම්කරු දිනයේ ඓතිහාසික වටිනාකම පමණයි. පෙලපාලි ගැන, රැස්වීම් ගැන, වේදිකා ගැන, සවන පිනන පොරොන්දු ගැන ලියන්නද

ගතවෙන සෑම වසරක් පාසාම අවම හා අහිමි වන කම්කරු අයිතීන් හා ඉල්ලීම් වෙනුවෙන් කම්කරුවනට කම්කරු දිනය සැමරීම උදෙස ලැබෙන්නේ වසරකට වරක් අළුත් වන සටන් පාඨ වෙනුවෙන් මුර ගෑමක්, දර්ශනීය වේදිකා, පෝස්ටර්, කටවුට් නැරඹීමත් පමණක් නොවේද? ශක්තිය හා එකමුතුව වෙනුවට රජයන්නේ බෙදීම හා කුලල් කා ගැනීම නොවේද? ලෝකය ඉදිරියට යන්නේ මේ සියළු වෙනස්වීම් ද සමඟයි. කෙසේ වෙතත් තවමත් මේ දිනය හරිහැටි තේරුම් ගෙන ඒ දිනය වෙනුවෙන් අවංකවම කැපවෙන සොයුරන් අතරින් පතර හෝ දකින්නට ලැබීම සතුටක්. ඔවුනට අපේ ආචාරය.

### වෙසක්

වෙසක් උත්සවය සැමරෙන්නේ පන්සල මුල්කොට ගෙනයි. ගිය සතියේ විවිධ ආගම් පිළිබඳ කථා බහකදී මිතුරෙක් මෙහෙම අදහස් දෙකක් කිව්වා. එක පන්සල, පල්ලිය, කෝවිල හා දේවාලය අතර ඇති වෙනස කුමක්ද? වෙනස නම් පල්ලිය, කෝවිල හා දේවාලය තුල ඇත්තේ ක්‍රිස්තියානි, මුස්ලිම් හෝ හින්දු වශයෙන් එක් ආගම් පරිසරයක් හා පන්සල තුල ඇත්තේ බහු ආගම් පරිසරයක් බවය. දැල්වෙන්නේ එකම පහනක් වුවත් සත්‍ය එයයි.

දෙක - ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු බැතිමතුන් සියල්ලෝම යාඥා යැදීම කරන අතර බෞද්ධයන් කරන්නේ භාවනාවයි. යාඥා හා යැදීම් යනු ආත්මාර්ථකාමී වාසියක් තකා ලෞකික ආශාවන් ඉටුකර ගැනීමේ මාර්ගයකි. එය මමත්වය වර්ධනය කරන්නක් වේ. භාවනාව යනු තමන්ගේ ආධ්‍යාත්මය අලුත්වැඩියා කර සංස්කරණය කිරීමක් වැනිය. කථාව ඇත්ත. බුදුවරුන්ට ශාස්තෘවරුන්ට කල හැක්කේ නිවැරදි මග කියාදීම පමණයි. අප විසින් වීරිය කොට විමුක්තිය සොයා ගත යුතුයි. මේ වෙසක් සමයේ අප විසින් සිහි කොට ගත යුත්තේ එයයි.

### හීරෝ සහ නීරෝ

මහින්ද ජනාධිපතිතුමා මේ චරිත දෙකම සාර්ථක විදිහට රඟපානවා දැක්කම වැඩියෙන්ම සතුටු වෙන්න ඇත්තේ ඔහුව ටෙලි නාට්‍යයකින් තිරයට හඳුන්වල දුන්න රන්ජන් සිල්වා වෙන්න ඇති. ඒත් කිසිම නළුවෙකුට තබා විධායක ජනාධිපතිවරයෙකුටවත් චරිත දෙකක් එකවර රඟපාන්න බැහැ.

මේ පසක් වෙමින් ඇත්තේ එයයි. ජනතාව මෙතෙක් දුටු හීරෝගේ චරිතයේ ආයුෂ දැන් අවසන් වෙමින් තිබෙනවා. දැන් පැමිණ ඇත්තේ නීරෝගේ වාරයයි. එළඹෙමින් පවතින්නේ හීරෝට හුරේ දැමූ ජනතාවට මුව අයා දැස් අයාගෙන බලා සිටින්නට වෙන කාලයයි. කරවටක් අර්බුදවල ගිලී ඇති රටක නායකයෙකුගේ මේ හැසිරීම අපට සිහිපත් කරවන්නේ කලකට පෙර අර්බුද සමයේ පාපන්දු ගැසූ නායකයෙකුගේ ලක්ෂණයි. විපක්ෂයේ ඇති ඈලි මෑලි දුබල ගතිය ඉදිරියේ තමන් ඉතාමත් ශක්තිමත් හා බලවත් තත්ත්වයක සිටින්නේ යැයි කල්පනා කරමින් මිතුරන් සතුරන්ගේ ගොඩ දමා සතුරන් මිතුරන් සේ ගනිමින් දැලි පිහියෙන් කිරි කන්නා සේ අතුරක යන මේ ගමන කොතැනින් අවසන් වේද?

### අවුරුද්දට පසුවදනක්

ටෙක් එකේ කට්ටියගේ අවුරුදු උත්සවය ගැන කියන්න දෙයක් නැහැ. විශිෂ්ඨයි. ඒක මෙල්බර්න් වාසී කවුරුත් වසරක් පාසා අත්විඳින සත්‍යයක්. ඒත් සහෝදරවරුනි, ඔබ විසින් නොමිලයේ ලබාදුන් අවුරුදු දිවා ආහාර වේල නැවැත්වූ වසරේ පටන් මේ දක්වා අවුරුදු උත්සව දිනට ජනතාවට දිවා ආහාරය ලබා ගැනීමේදී ඇති දුෂ්කරතාවය ගැනයි මේ සටහන. ආහාර නිකුත් කිරීම ඔබ සංවිධානය විසින්ම පමණක් කිරීම නිසා ඇතිවන තදබදය ගැන ඔබට අමුතුවෙන් ලිවිය යුතු නැතැයි සිතනවා. එවැනි දිනක කෑම සඳහා පැයක් දෙකක් පෝලිමේ සිටීමට සිදුවීම මහත් අපහසුවක් බව ඔබට වැටහෙනවා ඇති. ඉදිරියටත් ආහාර ලබාදීම ඔබ විසින්ම පමණක් කරනවා නම්, මෙයට වඩා ක්‍රමවත් හා පුළුල්ව කරනු ඇතැයි ද , නැතහොත් වෙනත් ආයතනයකගේ සහය ලබාගෙන හෝ මේ අපහසුව මඟහරවා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලනවා. කරුණාකර මේ ප්‍රශ්නයට ඔබ සංවිධානයේ කාරුණික අවධානය යොමුකර විසඳුමක් දෙනු ඇතැයිද සිතනවා.

### Mother's Day

මව්වරුන්ගේ දිනය සුළුවෙන් හෝ සමරමින් වුවත් පොදුවේ ආසියාතික අපි තවමත් ඒ දෙස බලන්නේ උපහාසයෙන්, ඇත්ත ඒකය. සතිදෙක තුනකට කලින් මව්වරුන්ගේ දිනයට පෙර වෘතීමය කටයුත්තකට කොලින්වුඩ් වල වැඩිහිටි නිවාසයකට යන්න වුණා. එහිදී ගතකල වරුවක පමණ කාලය තුළ හමුවී කතා කළ මව්වරුන් මේ දිනය පිළිබඳව ඔවුන් තුළ ඇති බලාපොරොත්තුව, ආශාව නොසඟවා හෙලි කලා. ඔවුන් පල කල අදහස් දැනුදු මහත් සංවේගයක් දනවනවා. ඔවුනට එම නිවස්නයේ කිසිඳු අඩුපාඩුවක් තිබුනේ නැහැ. එහි සිටි එක් මාතාවකගේ දරුවන් ඇය හමුවීමට එන්නේ වසරකට වරක් එම දිනයේදීලු. ඒ බව ඇය අප හා පැවසුවේ මඳ සිනහවක් මුවේ රඳවා ගෙන වුවත් ඇගේ දැස් අග නොවැටී දිලිසෙමින් තිබූ කඳුළු බිඳුව දාරක ස්නේහය පිළිබඳ දහසක් දේ අපට දැන්වුවා. මෙවැනි වැඩිහිටි නිවාස මෙල්බර්න් වල පමණක් කොපමණ තිබේද? ඇත්තටම ඕස්ට්‍රේලියාව වැනි රටකට නම් මව්වරුන්ගේ දිනයක් අවශ්‍යමය.

### බුද්ධංගල ආනන්ද තරුණයෝ සහ ප්‍රවෘත්ති

කර්නල් වීරසේකර මහන වෙලා රහත් උනත් අපට ගැටලුවක් නැහැ. ඒත් ඒපිට දමලා ඉතිහාසය විකෘති කරලා ප්‍රවෘත්ති කියන්න මෙල්බන් රේඩියෝවේ නිමල්ලා ඉදිරිපත්වීම

***<u>යහපත් සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් ජීවිත කැප කල මියගිය ජීවත් වෙන විරුවන්ට අවමන් කරන්න දෙන්න පුළුවන් කමක් නැහැ.</u>***

ගැන කණගාටුයි. ප්‍රවෘත්ති සරල විදිහට නොදන්න කමට කියලා දැම්මට එතැන සිදුවුනේ බරපතල වරදක්.

**88-89 තරුණයෝ නොමග ගියා කියලා කියන්නේ මොන පදනමකින්ද?** තමන්ගේ නව යෞවනය, ආශාවන්, බලාපොරොත්තු සිහින සියල්ල සමාජය වෙනුවෙන් කැප කරමින් අයුක්තියට අසාධාරණයට එරෙහිව සටන් වැදීම නොමඟ යාමක් ලෙස අර්ථ දක්වන්න පුළුවන් කොයි එකාටද? තරුණයෝ නොවෙයි මුළු රටම නොමඟ ගියේ 88-89 ද? නැත්නම් 77 හා 82 ද? ඒකේ ප්‍රතිඵල නේද? තාමත් අපේ රටේ මිනිස්සු අත් විඳින්නේ. යහපත් සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් ජීවිත කැප කල මියගිය ජීවත් වෙන විරුවන්ට අවමන් කරන්න දෙන්න පුළුවන් කමක් නැහැ.

මේ නොමග ගියා කියන තරුණයෝ සුමඟට ගන්න හදපු හැටි ගැන හොඳ අත්දැකීම් සංක්‍රමනිකයාටත් තියෙනවා. තරුණයෝ පුනරුත්ථාපනය කරන්න ආනන්ද වීරසේකර කරපු උලව්වක් නැහැ. රැඳවුම් කඳවුරුවල ගාල් කරල හිටපු දහස් ගණන් රැඳවියෝ නොකා නොබී උපවාස කරල උද්ඝෝෂණ කරපුවයේ ප්‍රතිඵල ලෙස බිහි උන සෝසා

***<u>මේ සමාජයේ ඕනෑම ජඩ වැඩක් කරල බොහොම ඉක්මනට සිල් මූනක් දාගෙන ඉන්න පුළුවන්</u>***

කම්ටු, ජයලත් කම්ටු හරහා තමයි පුනරුත්ථාපන කටයුතු සිදුවුණේ. වීරසෙ-'කරලා කලේ අන්තිමට ඇවිත් නම දාගත්ත එකයි. මේ උද්ඝෝෂණ කරපු නිරායුධ රැඳවියෝ හමුවෙන්න බඩතුරේ රිවෝල්වර හංග ගෙන ඇවිත් කටපුරා බුදු සරණයි කියලා වීරසේ කරල කියපු බයිලා අපට හොඳට මතකයි. මේ වීරසේකරලාම තමයි, දළුවත්තලාත් එක්ක 88 මුල් කාලේ මේ තාරුණ්‍ය වඳ කරන්න පිඹුරු පත් හැදුවේ. ඒ ගැන විස්තර මෙයාලත් එක්ක ඒ කාරිය අගේට කරල පස්සේ ඒ ගැන පාපෝච්චාරනය කරල රංජිත් පීරිස් ලියපු ''පන ඇති දෙව්වරු'' පොතේ අගේට තියෙනවා.

මේ සමාජයේ ඕනෑම ජඩ වැඩක් කරල බොහොම ඉක්මනට සිල් මූනක් දාගෙන ඉන්න පුළුවන් ඒ නිසාම තමයි. වීරසේකරලාට ආනන්ද නොවෙයි මෛත්‍රී නමින් බුදුවෙන්න උනත් මේ ක්‍රමය යටතේ ඉඩ සැදිලා තියෙන්නෙ.
අනේ සාදු.....

**සංක්‍රමණිකයා**

### තේරුම සොයන්න

| | |
|---|---|
| ගසත් සැබැයි ගස මුල අතු පතුත් | නැතී |
| ගෙඩිත් සැබැයි ගෙඩියේ ඇට මදත් | නැතී |
| නැට්ට නැතුව මේ ගෙඩියේ දෙකොණ | ගතී |
| කෑවෝතින් රෑ තුන්යම නින්ද | නැතී |

විසඳුම 34 වන පිටුවේ

**වින්ධ්‍යා මල්වත්ත**
වාද්දූව

### මාස්ටර් සර්



*ලංකාවේ අඩුවෙන්ම සිය දිවි නසා ගන්නේ දේශපාලකයොලු මාස්ටර්..*

*ඒක හරි...*
*අනිත් අයට සිය දිවි නසා ගන්න වෙලා තියෙන්නෙ දේශපාලකයො නිසානෙ..*

### කවි කොළය

*පසුගිය ක්‍රිකට් කූසලානය තිබුනු වෙලේ*
*ගිල්ක්‍රිස්ට් පන්දුවට රහසින් කළ හදිය*
*පැමිණිලි කලත් පරිපාලන කවුන්සලේ*
*දුන් තීරණය ගැන කවි කොළයට ලියමී*

*පූරුවෙ වාසනාවට කැන්ගරුවන්ගේ*
*හිටියේ නැහැනෙ ලොකු පුටුවේ ඩැරල් හෙයා*
*එහෙනම් ඔසීලට දාලා තහංචිය*
*දෙනවා ලෝක කූසලානය මහේලට*

වෙත්තසිංහ

සිංහල නවකතා ලෝකයට නව මුහුණුවරක ප්‍රබන්ධයක්...
ළමා මනස වඩවා ගන්නට මාර්ගෝපදේශකයක්...




බ්‍යාමප්‍රභාව
1 සහ 2

ළමයි
හදන්නේ
කොහොම ද?




සූරිය පොත්හලෙන් හා අන්තර්ජාලයේ
www.lankahands.com
වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.
www.dpsdvm.com/AruniShapiro